*සැ. යු.*–2007.08.17 වැනි දින පළ වූ අංක 1,511 දරන *ගැසට් පත්‍රයෙහි* IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,512- 2007 අගෝස්තු 24 වැනි සිකුරාදා - 2007.08.24**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 757 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 757 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 758 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 අගෝස්තු මස 31 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අගෝස්තු මස 17 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

DRF/21/RECT/2347.

2007 අංක 316

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු ) උපසේවයට මාරු කිරීමක්

### නිල ස්ථිර කිරීමක්

පහත නම සඳහන් නිලධාරි 2006 ජුනි මස 17 වන දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/61185 කපිතන් (උපකරණ පාලක) (තාවකාලික මේජර්) (උපකරණ පාලක) රණසිංහ පැටිකිරි කෝරාළලාගේ ගුණතිලක යූඑස්පී ශ්‍රීලකාහ

### විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 ජුනි මස 18 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/61185 මේජර් (උපකරණ පාලක ) රණසිංහ පැටිකිරි කෝරාළලාගේ ගුණතිලක යූඑස්පී ශ්‍රීලකාහ

### *ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම*

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2006 ජුනි මස 18 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු ) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/61185 මේජර් (උපකරණ පාලක) රණසිංහ පැටිකිරි කෝරාළලාගේ ගුණතිලක යූඑස්පී ශ්‍රීලකාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජුනි මස 09 වැනි දින,
කොළඹ දී ය.

08 – 704

---

DRF/21/RECT/2398.

2007 අංක 317

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

### නිල ස්ථිර කිරීමක්

පහත නම සඳහන් නිලධාරි 2006 සැප්තැම්බර් මස 18 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) (තාවකාලික මේජර්) (උපකරණ පාලක) රණවීර පැටිකිරි කෝරාලලාගේ ලාල් රංජිත් රණවීර, යූඑස්පී ශ්‍රීලංසිරෙ (නි/61203)

### විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරි 2006 සැප්තැම්බර් මස 19 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් (උපකරණ පාලක) රණවීර පැටිකිරි කෝරාලලාගේ ලාල් රංජිත් රණවීර, යූඑස්පී ශ්‍රීලංසිරෙ (නි/61203)

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරි 2006 සැප්තැම්බර් මස 19 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් (උපකරණ පාලක) රණවීර පැටිකිරි කෝරාලලාගේ ලාල් රංජිත් රණවීර, යූඑස්පී ශ්‍රීලංසිරෙ (නි/61203)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය
පිළිබඳ අමාත්‍යාංශය.

2006 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

08-700

---

DRF/21/RECT/2406.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල පහත හෙළීමක් සහ විශ්‍රාම ගැනීමක්

### නිල පහත හෙළීමක්

පහත නම සඳහන් නිලධාරි 2006 අප්‍රේල් මස 30 වන දින සිට කපිතන් නිලයට නිල පහත හෙළීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (තාවකාලික මේජර්) සිරිවර්ධන ආරච්චිගේ චන්ද්‍රනාත් කරුණාරත්න සබුබ (නි/64572)

### විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2006 මැයි මස 01 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන්

විසින් අනුමත කර ඇත.

කපිතන් සිරිවර්ධන ආරච්චිගේ චන්ද්‍රනාත් කරුණාරත්න සබුබ (නි/64572)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පි ආර්එස්පි පීඑස්සී
ලේකම්
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය

2006 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

08-702

---

DRF/21/RECT/2404

2007 අංක 318

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 ඔක්තෝම්බර් මස 08 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.–

ලුතිනන් අධිකාරි විතාරමලාගේ සුනිල් අධිකාරි විතාරණ ආර්ඩබ්පී, ආර්එස්පී ගරෙ (නි.64163)

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ඔක්තෝම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

08 – 701

---

DIRF/RECT/86(vi) AY

2007 අංක 319

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම

පහත නම සඳහන් කැඩෙට් නිලධාරිණිය 2003 ඔක්තෝම්බර් මස 31 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවෙනි ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පල කරනු ලැබ තිබේ.

සී/55542 කෙඩෙට් නිලධාරිනී දළුවත්ගොඩ විතානගේ ඉමාලි නදීකා යාපා කුලතුංග

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජුලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

08 – 673

---

DIRF/RECT/88/(VII)AY

2007 අංක 320

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම

පහත නම සඳහන් කෙඩෙට් නිලධාරි 2006 මාර්තු මස 28 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ, දෙවැනි ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කිරීම සඳහා හා එදිනම සිට බලපැවැත්වෙනසේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව වෙත ඇතුලත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පලකරනු ලැබ තිබේ.

කෙඩෙට් නිලධාරි මීපේ ගණිතගේ සංජීව ලසන්ත – (සී/55905)

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජුලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

08 – 675

---

DIRF/RECT/86(iv) AY

2007 අංක 321

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම

පහත නම සඳහන් කැඩෙට් නිලධාරිණිය 2006 අප්‍රේල් මස 28 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවෙනි ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පල කරනු ලැබ තිබේ.

සී/56198 කෙඩෙට් නිලධාරිනී ප්‍රසාදනී ශෂිකලා සේනාධීර.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

08 – 674

---

DIRF/RECT/86/(VI)AY.

2007 අංක 322

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම

පහත සඳහන් කෙඩෙට් නිලධාරි/ නිලධාරිනිය 2006.05.11 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවෙනි ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එදිනම සිට බලපැවැත්වෙනසේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සී/56182 කෙඩෙට් නිලධාරිනි ෆාතුමා ෆස්මීනා ඉශ්රත්,
සී/56185 කෙඩෙට් නිලධාරි නිලුපුල් ප්‍රියදර්ශන සම්පත් හඳපාන්ගොඩ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂාව, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජූලි මස 25 වැනි දින,
කොළඹ දී ය.

08 – 676

---

ඩීඅයිආර්එෆ්/ආර්ඊසීටී/235ඒවයි.

2007 අංක 323

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ඇතුළත් කිරීම

අංක 1453 හා 2006 ජූලි මස 07 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 2006 අංක 139 මගින් ප්‍රකාශයට පත් කරන ලද අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවැනි ලුතිනන් වරුන් වශයෙන් අධිකාරියට පත් කරනු ලැබූ පහත නම සඳහන් නිලධාරීන්/නිලධාරිනියන් දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා පිළිවෙලින් දක්වා ඇති දිනයේදී, ඔවුන්ගේ නම ඉදිරියෙන් පෙන්වා ඇති රෙජිමේන්තුව/බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළකරනු ලැබ තිබේ :

*2006 දෙසැම්බර් මස 23 වැනි දින සිට*

1. සී/56596 දෙවැනි ලුතිනන් ක්‍රිෂානි නිරෝෂා අබේවික්‍රම – ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය ;
2. සී/56434 දෙවැනි ලුතිනන් ජයවීරගේ රංජිත් කුලසිරි – ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව ;
3. සී/56435 දෙවැනි ලුතිනන් අබේසිංහ මුදියන්සේලාගේ දිලාන් තාරක අබේසිංහ – ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව;
4. සී/56597 දෙවැනි ලුතිනන් හේරත් රාජකරුණා අතපත්තු වාසල මුදියන්සේලාගේ ඉෂාර අකලංග තියන්ගොඩ – සන්නද්ධ බුද්ධි බලකාය
5. සී/56605 දෙවැනි ලුතිනන් ගයනාත් එරංග අළුත්විදිය කෝරාල – ගැමුණු හේවා බලඇණිය ;
6. සී/56601 දෙවැනි ලුතිනන් රාජපක්ෂ සේනාධීර ආරච්චිගේ ජීවනී පබසරා රාජපක්ෂ – ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය
7. සී/56450 දෙවැනි ලුතිනන් කාරියවසම් බැන්ඩිගොඩ ගමගේ යුෂාන් නිරංජන කාරියවසම් – ශ්‍රී ලංකා සංඥා බලකාය
8. සී/56438 දෙවැනි ලුතිනන් කැලුම් චමින්ද බණ්ඩාර විජේකෝන් – ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
9. සී/56451 දෙවැනි ලුතිනන් සිංහ කොච්චිලාගේ සංජීව උදයංග චන්ද්‍රසේකර – ශ්‍රී ලංකා සංඥා බලකාය ;
10. සී/56598 දෙවැනි ලුතිනන් රත්තේපිටියේ ගෙදර සුමුදු සම්පත් කුමාර ප්‍රේමරත්න – ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය ;
11. සී/56446 දෙවැනි ලුතිනන් – සමරතුංග මුදියන්සේලාගේ ප්‍රදීප් ප්‍රියමල් බණ්ඩාර සමරතුංග – ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව ;
12. සී/56600 දෙවැනි ලුතිනන් කාන්ගර මුදියන්සේලාගේ තිළිණ රන්ධික උලපනේ – ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය ;
13. සී/56432 දෙවැනි ලුතිනන් අත්තනායක මුදියන්සේලාගේ විශ්වජිත් අසංක අත්තනායක – ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය
14. සී/56599 දෙවැනි ලුතිනන් ලියනගේ තුෂාර අනුර ලියනගේ – ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ;
15. සී/56433 දෙවැනි ලුතිනන් රත්නායක රාළලාගේ ලලිත් දුමින්ද රත්නායක – ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව;
16. සී/56607 දෙවැනි ලුතිනන් වැගපිටිය විතාරණලාගේ දර්ශණ වජිරනාත් කුලතුංග – ගැමුණු හේවා බලඇණිය;
17. සී/56467 දෙවැනි ලුතිනන් ජෝශප් කුමාර් – ශ්‍රී ලංකා සංඥා බලකාය
18. සී/56610 දෙවැනි ලුතිනන් මොහොමඩ් ශිෂාන් – විජයබාහු පාබල රෙජිමේන්තුව;
19. සී/56606 දෙවැනි ලුතිනන් සචේතන වික්‍රමරත්න සිරිවර්ධන – ශ්‍රී ලංකා පාබල හමුදාව;
20. සී/56595 දෙවැනි ලුතිනන් ගයානි මදුරිකා බෝදරගම – ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය;
21. සී/56612 දෙවැනි ලුතිනන් වන්නිනායක මුදියන්සේලාගේ දුලංග වන්නිනායක – ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය;
22. සී/56611 දෙවැනි ලුතිනන් පහළගෙදර ආනන්ද සම්පත් ජයසේන – ශ්‍රී ලංකා පාබල හමුදාව;
23. සී/56609 දෙවැනි ලුතිනන් අච්චාහන්දි තුසිත අමරතුංග ද සිල්වා – ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව;
24. සී/56426 දෙවැනි ලුතිනන් විජේසේකර ආරච්චි පටබැඳිගේ දිල්රුක් දර්ශන - ඉංජිනේරු සේවා බලකාය;
25. සී/56603 දෙවැනි ලුතිනන් ඉන්දික ශ්‍රීමාල් බණ්ඩාර නුගවෙල – ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය;
26. සී/56449 දෙවැනි ලුතිනන් හේවා කළුමුල්ලගේ නිලන්ත කුමාර කළුමුල්ලගේ – ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව;
27. සී/56425 දෙවැනි ලුතිනන් ඉඹිහාමිල්ලාගේ ගයාන් සේනාධීර – ඉංජිනේරු සේවා බලකාය;
28. සී/56413 දෙවැනි ලුතිනන් එදිරි බන්දනගේ ධනුෂ්ක නිමල් ශාන්ත – ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව;
29. සී/56411 දෙවැනි ලුතිනන් නරාවල බොකරගොඩගේ යසන්ත චන්ද්‍රජිත් – ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව;

30. සී/56431 දෙවැනි ලුතිනන් ලොකුරාලලගේ දොන් ජිනේන්ද්‍ර ධම්මික ජයසේකර – ශ්‍රී ලංකා සංඥා බලකාය;
31. සී/56448 දෙවැනි ලුතිනන් නාකන්දලගේ බුද්ධික සංජීව – ශ්‍රී ලංකා සංඥා බලකාය;
32. සී/56602 දෙවැනි ලුතිනන් පිටකෝට්ට මෙරිඤ්ඤගේ සුධිරා දේව්නි පෙරේරා – ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය;
33. සී/56460 දෙවැනි ලුතිනන් නුවරපක්ෂ ජේඩිගේ සරත්මධු සිසිර කුමාර – ශ්‍රී ලංකා සංඥා බලකාය;
34. සී/56430 දෙවැනි ලුතිනන් අසන්ක උත්පල හිදැල්ල ආරච්චි - ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව;
35. සී/56604 දෙවැනි ලුතිනන් ලොකු ලියනගේ චරිත් සුදර්ශන කබ්රාල් – ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව ;

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජූලි මස 23 වැනි දින,
කොළඹ දී ය.

08-672

---

DVF/RECT/262.

2007 අංක 324

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2006 මාර්තු මස 15 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතාන් වැල්ලගේ දමිත මහීස්සර ද සිල්වා, ශ්‍රීලංඉ (නි/2785)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ඔක්තෝබර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

08 – 768/1

---

DVF/RECT/262

2007 අංක 325

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරී 2007 ජනවාරි මස 31 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතාන් අබේසිංහ හේරත් මුදියන්සේලාගේ අනුර රත්නායක විපාරෙ (නි/5588)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ඔක්තෝම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

08 – 768/2

---

# ආණ්ඩුවේ නිවේදන

## අම්පාර පොලිස් කොට්ඨාසයේ දෙහිඅත්තකණ්ඩිය පොලිස් බලප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 14 ක් පොලොන්නරුව පොලිස් කොට්ඨාසයේ අරලගංවිල පොලිස් බලප්‍රදේශයට අනුයුක්ත කිරීම

රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ 03/ඒ1/49/373/07 අංක හා 2007.02.21 දිනැති ලිපියට අනුව 2007.02.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජනතාවගේ පහසුව සඳහා පහත සඳහන් ග්‍රාම නිලධාරී වසම් 14 දෙහිඅත්තකණ්ඩිය පොලිස් බල ප්‍රදේශයේ සිට අරලගංවිල පොලිස් බල ප්‍රදේශයට අනුයුක්ත කර ඇත :

1. 221 - ඉහල යක්කුරේ
2. 222 - පිහිටි වැව
3. 223 - පහල යක්කුරේ
4. 224 - නුවරගල
5. 225 - දමනේ වැව
6. 226 - නවගහ ඇල
7. 230 - මල්දෙනිය
8. 231 - සඳගලතැන්න
9. 278 - කැකුළුවෙල
10. 294 - මීවත්පුර
11. 297 - පල්ලේගම
12. 298 - මුදුන්ගම
13. 299 - සිරිපුර
14. 300 - සැලසුම්ගම

ඉහත ග්‍රාම නිලධාරී වසම් 14 අධිකරණ බලප්‍රදේශය දෙහිඅත්තකණ්ඩිය මහෙස්ත්‍රාත් අධිකරණය වන අතර මින් ඉදිරියට ද එසේම ක්‍රියාත්මක වනු ඇත.

වයි. පී. වික්ටර් පෙරේරා,
පොලිස්පති.

2007 ජූලි මස 13 වැනි දින,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

08-631/1

## වත්තල පොලිස් බලප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 05 ක් කිරිබත්ගොඩ පොලිස් බලප්‍රදේශයට අනුයුක්ත කිරීම

රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ අංක 03/ඒ1/49/372/06 හා 2007.02.26 දිනැති ලිපියට අනුව 2007.02.26 දින සිට ක්‍රියාත්මක වන පරිදි පරිපාලන කටයුතුවල පහසුව සඳහා වත්තල පොලිස් බල ප්‍රදේශයට අයත්ව තිබූ පහත සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාස 05 කිරිබත්ගොඩ පොලිස් බල ප්‍රදේශයට අනුයුක්ත කර ඇත :

1. 256 - හුණුපිටිය (උතුර)
2. 256 ඒ - හුණුපිටිය (දකුණ)
3. 256 ඩී - හුණුපිටිය (නැගෙනහිර)
4. 256 බී - විල්ලේගොඩ
5. 256 සී - නාහේන

මෙම ග්‍රාම නිලධාරී වසම්වල අධිකරණ බල ප්‍රදේශය වත්තල මහෙස්ත්‍රාත් අධිකරණ බල ප්‍රදේශය වන අතර මින් ඉදිරියට ද එසේම ක්‍රියාත්මක වනු ඇත.

වයි. පී. වික්ටර් පෙරේරා,
(පොලිස්පති).

2007 ජූලි මස 13 වැනි දින,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

08-631/2

---

## හිනිදුම සහකාර පොලිස් අධිකාරි කාර්යාලයක් පිහිටුවීම

රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ අංක 03/එස්/790/2007 හා 2007.04.24 දිනැති ලිපියට අනුව 2007.04.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි හිනිදුම සහකාර පොලිස් අධිකාරි කාර්යාලයක් පිහිටුවනු ලැබූ බව සියළු දෙනාගේ දැන ගැනීම පිණිස නිවේදනය කරනු ලැබේ.

වයි. පී. වික්ටර් පෙරේරා,
පොලිස්පති.

2007 ජූලි මස 25 වැනි දින,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

08-631/3

## අධ්‍යාපන අමාත්‍යාංශය

### පළාත් සභා යටතේ පවතින දුෂ්කර පළාත් පාසල්වල ඉංග්‍රීසි ගුරුවරුන් වශයෙන් පත්කිරීමට සහ ජාතික ශිෂ්‍යභට බලකාය වශයෙන් අධිකාරියට පත්කිරීම සඳහා සුදුස්සන් බඳවා ගැනීම - 2006

පළාත් සභා යටතේ පවතින දුෂ්කර පළාත් පාසල්වල ඉංග්‍රීසි ගුරුවරුන් වශයෙන් පත්කිරීමට සහ ජාතික ශිෂ්‍යභට බලකාය වශයෙන් අධිකාරියට පත්කිරීම සඳහා සුදුස්සන් බඳවා ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත.

මේ සම්බන්ධව රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය යටතේ ජාතික ශිෂ්‍යභට බලකායේ අධ්‍යක්ෂ විසින් අංක 1469 හා 2006.10.27 දින *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය අනුව අයදුම් පත් කැඳවන ලදී. ඉන් පසු 2007.06.07 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කළ නිවේදනයක් මගින් උක්ත *ගැසට් නිවේදනය* අවලංගු කර ඇත.

රාජ්‍ය ආරක්ෂක මහජන ආරක්ෂාව නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය මගින් 2006.10.27 දින *ගැසට් නිවේදනය* අනුව කැඳවන ලද අයදුම් පත් හා 2007.02.25 දින පවත්වන ලද එම තරඟ විභාගයේ ප්‍රතිඵල ඉහත පළවන ඡේදයේ බඳවා ගැනීම සඳහා වලංගු වේ.

ආරියරත්න හේවගේ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2007 අගෝස්තු මස 02 වැනි දින.

08-703

---

## මාතර බිනර මහ පෙරහැර

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ පවත්වනු ලබන 2007 බිනර මහ පෙරහැර 2007 සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වනු ලබන බව වන්දනාගමන් ආඥාපනත යටතේ 175 පරිච්ඡේදයේ ) 1959 නොවැම්බර් මස 20 දින නිකුත් කරන ලද 11959 දරන *ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසිවල 10 වන වගන්තිය යටතේ මෙයින් දන්වමි.

තුසිත පී. වනිගසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2007 අගෝස්තු මස 07 වැනි දින,
මාතර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

08 – 802

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ජාතික ඉතිරි කිරීමේ බැංකුව

ණය අංක : 14668/17 සහ 17492/15.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.09.23 දින පවත්වන ලද රැස්වීමේ දී, මෙහි පහත දැක්වෙන යෝජනාව, විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව, 1995 අංක 24 දරන පනතින් සංශෝධිත, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

"ජාතික ඉතිරිකිරීමේ බැංකුව නමට, ප්‍රසිද්ධ නොතාරිස් කේ. පලිහක්කාර විසින් සහ වයි. එෆ්. ඩීන් විසින් පිළිවෙලින් ලියා සහතික කරන ලද අංක 1794 හා 2089 සහ 1995.06.01 හා 1998.02.09 දින දරන උකස් බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, උකස්කරුවන් වන, (කලින් පානදුර, අලුබෝමුල්ල, රාජා සමරනායක මාවත, අංක 5/ඒ සහ පිළියන්දල, බෝකුන්දර, නිවන්තිඩිය, රත්න මාවත, අංක 185/2 දරන ස්ථානවල පදිංචිව සිටි) දැනට වාද්දුව, කොරොස්දුව, අංක 94 "ගෝල් විව්" හි තොටවත්තගේ අනිල් උෂාන් ජයතිලක යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, දැනට එකී උකස් බැඳුම්කර මත 2005.10.17 වැනි දිනට රුපියල් තුන්ලක්ෂ අනූහතර දහස් දෙසිය නවයකුත් ශත තිහක (රු. 3,94,209.30) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

එකී රුපියල් තුන්ලක්ෂ අනූ හතර දහස් දෙසිය නවයකුත් ශත තිහක් (රු. 3,94,209.30) වූ මුදල, 2005.10.17 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා වර්ෂයකට සියයට දහහත (17%) හා සියයට පහළොව (15%) බැගින් වූ පොලියද, සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියට අනුකූලව අයකරගත හැකි මුදල් ප්‍රමාණයන් ද ප්‍රචාරක වියදම් හා දරන ලද වෙනත් ගාස්තු ද (ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා, ඉහත කී අංක 1794 හා 2089 දරන බැඳුම්කරය මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත උකස් කර ඇති, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන දේපළ හා පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.”

### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, උතුරු කලුතර තොටමුණේ, වාද්දු වස්කඩු දෙබද්දේ, කලුතර ප්‍රාදේශීය සභාවේ, වස්කඩුව උපකාර්යාල බල ප්‍රදේශය සීමාව ඇතුළත, මොල්ලිගොඩ පිහිටි කොරොස්දූවවත්ත නමැති ඉඩමේ කොටසක් නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු එන්. පී. ඇල්විටිගල විසින් මැන සාදන ලද අංක 468 හා 1994 ජුනි 12 දින දරන පිඹුරේ දැක්වෙන, ලොට් අංක 94 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට - ලොට් අංක 95ද, නැගෙනහිරට - ලොට් අංක 95, 59 සහ 60 ද, දකුණට - ලොට් අංක 61 සහ 93 ද බස්නාහිරට - ලොට් අංක 93 සහ 34 ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 468 දරන පිඹුර ප්‍රකාර පර්චස් පහළොවක් (අ. 0 රූ. 0. ප. 15) විශාලත්වය ඇති, පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 74/317 යටතේ ලියාපදිංචි වී තිබෙන ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

මෙයට මෙහි පහත විස්තර කරන, පාරවල් සඳහා වෙන් කළ බිම් කොටස් මතින් සහ ඔස්සේ මාර්ග අයිතියද ඇතුළත් වේ.

(1) ඉහත කී මොල්ලිගොඩ පිහිටි, කොරොස්දූවෙවත්ත නමැති ඉඩමේ, ඉහත සඳහන් අංක 468 දරන පිඹුරේ පෙන්නුම් කරන තිබෙන ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට - අඩි පාර ද, නැගෙනහිරට - පාර ද, දකුණට ලොට් අංක 34, 2, 54, 57, 59 සහ 98 ද බස්නාහිරට - ලොට් අංක 2 සිට 13 සහ 15 ද යන මායිම් ඇතුළත, එකී අංක 468 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිස් හතකුත් දශම හතයි පහක් (අ.0 රූ. 0 ප. 37.75) විශාලත්වය ඇති, පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 103/142 යටතේ ලියාපදිංචි බිම් කට්ටිය.

(2) ඉහත කී මොල්ලිගොඩ පිහිටි, කොරොස්දූවෙවත්ත නමැති ඉඩමේ ඉහත සඳහන් අංක 468 දරන පිඹුරේ පෙන්නුම් කර තිබෙන ලොට් අංක 34 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වන උතුරට - ලොට් අංක 99 සිට 114, කුඹුර සහ ලොට් අංක 1, 56, 58 සිට 69 දක්වා, 42, 15, 35 සිට 41 දක්වා, 23 සිට 27 දක්වා 71, 73, 76, 82, 135,149 සිට 152 දක්වා ලොට් අංක 126, 125 සහ 134 ද නැගෙනහිරට : ලොට් අංක 149, 150, 82 සිට 96, 98, 71, 73, 75, 35, 55 ලොට් අංක 41 සිට 53 දක්වා සහ කුමාරි වන්නිගම හිමිකම් කියන ඉඩමද, ලොට් අංක 16 සිට 27 දක්වා, 81, 135, 152, 140 සිට 151 ද දකුණට : ලොට් අංක 16, 44, 74, 72, 28 සිට 33 දක්වා සහ 76 සිට 81 දක්වාද එම්. මාටින් සහ මියගිය ජේ. එච්. ඇලන්ගේ උරුමකරුවන් හිමිකම් කියන ඉඩම් ද, ලොට් අංක 130 සිට 134 දක්වා ද 115 සිට 128 දක්වා ද ලොට් අංක 152, 143 සිට 149 දක්වාද ලොට් අංක 98 ද බස්නාහිරට : ලොට් අංක 56, 58 සිට 62 දක්වා, 64 සිට 70 දක්වාද, ලොට් අංක 35 සිට 41 දක්වාද, 28 සිට 38 දක්වාද, 76 සිට 81 දක්වාද, 128 සිට 134 දක්වා සහ ලොට් අංක 123 කුඹුරු ඉඩම් සහ ලොට් අංක 126, 151, 152, 135 සිට 143, 99 සිට 101 දක්වාද යන මායිම් ඇතුළත ඉහත සඳහන් අංක 468 දරන පිඹුර ප්‍රකාර අක්කර එකකුත් රූඩ් තුනකුත් පර්චස් නවයයි දශම හයයි හතරක් (අ. 1, රූ. 3, ප. 9.64) විශාලත්වය ඇති, පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 103/143 යටතේ ලියාපදිංචි වී ඇති බිම් කට්ටිය.

කළමනාකරු - ණය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
255, ගාලුපාර,
කොළඹ 03.

08-641

## නිවැරදි කිරීමේ දැන්වීම

### සීමාසහිත සෙලාන් බැංකුව - විදේශ මුදල් බැංකු ඒකකය

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

කොස්මොස් මැකී ඉන්ඩස්ට්‍රීස්, ලිමිටඩ් යන සමාගමෙන් අයවිය යුතුව ඇති මුදල් අයකර ගැනීම සඳහා සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අප්‍රේල් මස 16 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ යෝජනාවක් සම්මත කර ගන්නා ලද අතර, එකී යෝජනා සම්මුතිය 2007 ජුලි මස 06 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* දී, 2007 ජුනි මස 27 වැනි දින ඩේලි මිරර්, ලංකාදීප සහ 2007 ජුනි මස 25 වැනි දින වීරකේසරි පත්‍රයේ ද ප්‍රසිද්ධ කරන ලදී.

ඉහත කී *ගැසට් පත්‍රයේ* සිංහල භාෂාවෙන් කළ පළ කිරීමේ සහ ඉහත කී ලංකාදීප පත්‍රයේ කළ පළ කිරීමේ ප්‍රමාද දෝෂයකින් උකස් කර ඇති දේපළ වෙන්දේසි කිරීම සඳහා බලයලත් වෙන්දේසිකරු ඩන්ස්ටන් කෙලාර්ට් මහතා පත්කර ඇති බව සඳහන්ව ඇත. එය බලයලත් ලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලෙස නිවැරදි විය යුතු බව මෙයින් නිවේදනය කර සිටින අතර, එකී දැන්වීමේ සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතිනු ඇත.

08-738

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යෝජනා සම්මුතියේ දැන්වීම

පහත දැක්වෙන යෝජනා සම්මුතිය නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ ජුනි මස 22 වැනි දින ඒකමතිකව අනුමත කරන ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය දරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

> කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ආර්. රණසිංහ විසින් සහතික කරන ලද වර්ෂ 2003ක් වූ අගෝස්තු මස 19 වැනි දිනැති අංක 3463 දරන උකස් බැඳුම්කරය මගින් (මෙහි මින් මතු උකස් බැඳුම්කරු යනුවෙන් සඳහන් කරනු ලබන) කොළඹ 13, මහා විද්‍යාල මාවතේ අංක 93/2 දරන ස්ථානයේ පදිංචි සහ කොළඹ 13, මහා විද්‍යාල මාවතේ අංක 93/2 දරන ස්ථානයේ රැම්කෝ ලංකා (කළම්බු) ඩිපෝට් යන නාමය, අභිධානය සහ ව්‍යාපාරය යටතේ තනි අයිතිකාරත්ව ව්‍යාපාරය කරගෙන යන කන්දයියා සුන්දරමූර්ති මහතා, එකී කන්දයියා සුන්දරමූර්ති මහතා විසින්, ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි ලෙස ආපසු ගෙවීමට ඇපයක් වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති අයිතීන්, දේපළ සහ පරිශ්‍රයන්, කොළඹ 01, යෝර්ක් වීදියේ, අංක 76හි පිහිටි (මෙහි මින්මතු “බැංකුව” යනුවෙන් සඳහන් කෙරෙන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද හෙයින් ද, තවද, එකී බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල ගෙවීමට එකී කන්දයියා සුන්දරමූර්ති මහතා යන අය පැහැර හරින ලදුව වර්ෂ 2007ක් වූ මැයි මස 17 වැනි දින විට නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත එකී බැඳුම්කරය මත රුපියල් මිලියන හතරකුත් හාරලක්ෂ තිස් දහස් අසූ හයයි ශත විසි හතරක (රු. 4,4,30,086.24) මුදලක් දැන අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,
>
> මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති අයිතින් දේපළ සහ පරිශ්‍රයන්, එකී මිලියන හතරකුත් හාරලක්ෂ තිස් දහස් අසූ හයයි ශත විසි හතරක (රු. 4,430,086.24) මුදල ද, වර්ෂ 2007ක් වූ මැයි මස 17 වැනි දින වන විට අයිරා ණය පහසුකම මත හිඟව ඇති ප්‍රාග්ධනය වන රුපියල් එක්ලක්ෂ හැටනව දහස් තුන්සිය තිස් දෙකකුත් ශත දෙකක (රු. 1,69,332.02) මුදලක් මත වර්ෂ 2007 ක් වූ මැයි මස 18 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා තවදුරටත් පොලිය ද, කාල ණය පහසුකම

මත වර්ෂ 2007 ක් වූ මැයි මස 17 වැනි දින වන විට හිඟ මුදල වන රුපියල් මිලියන තුනකුත් නව ලක්ෂයක් (රු. 3,9,00,000) වන මුදල මත වර්ෂ 2007ක් වූ මැයි මස 18 වැනි දින සිට එක් වර්ෂයකට සියයට විසි හයයි දශම බිංදුවයි හතරක් (26.04%) අනු ප්‍රමාණය බැගින් පොළිය ද, ණය අයිරා පහසුකමෙහි හිඟව පැවති මුල් මුදල වන රුපියල් හාරලක්ෂ අටසිය පණස් තුනකුත් ශත හතලිස් හතරක (රු. 4,8,53,000.44) මුදලක් ද ඒ මත එක් වර්ෂයකට සියයට 30% බැගින් පොළිය ද ඒ හා සම්බන්ධ ව්‍යවස්ථාපිත ගාස්තු ද, ප්‍රචාරය කිරීමේ ගාස්තු ද, වැය කරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (කිසියම් මුදලක් වේ නම්) මුදල අඩු කළ පසු මුදල, අයකර ගැනීම සඳහා කොළඹ වෙන්දේසිකරුවන් වන ත්‍රිවන්ක ඇන්ඩ් සේනානායක හි ත්‍රිවන්ක සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, කටුනායක-සීදුව මහ නගර සභා සීමාව ඇතුළත අමන්දොලුවේ පිහිටි, කුමාරතුංග මුණිදාස මාවත වරිපනම් අංක 386/3 දරන බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විසින් මැන සාදන ලද වර්ෂ 2000ක් වූ මැයි මස 06 වැනි දිනැති අංක 1626 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් සලකුණු කර ඇති බෙදා වෙන් කර ඇති එහි පිහිටි පස, ගහකොළ, පළතුරු සහ සියලුම දේ සමග වන 'දවටගහවත්ත' යනුවෙන් හඳුන්වනු ලබන බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල. එකී ලොට් 2 දරන කැබැල්ලට මායිම්, උතුරට : ලොට් 1 සහ එස්. ඩී. එම්. පී. සෙනෙවිරත්න සහ වෙනත් අයගේ සහ එස්. ජයසූරියගේ ඉඩම් ද, නැගෙනහිරට : ලොට් 4 ද, දකුණට : ලොට් 3 සහ පාර (පුද්ගලික) ද සහ බස්නාහිරට : ලොට් 4 ද වන එකී අංක 1626 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් හයයි දශම පහක් (අ. 0, රූ. 3, පර්. 6.5) වන අතර එය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 840/213 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි වී ඇත.

මෙහි පහත දැක්වෙන පරිදි ඒ මතින් සහ ඔස්සේ මාර්ග අයිතිවාසිකම ද සමග වේ.

1. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක සීදුව මහ නගර සභා සීමාව ඇතුළත අලුත්කුරු කෝරලේ දාසිය පත්තුව කොට්ඨාස අංක 11, අමන්දොලුව ග්‍රාමයේ පිහිටි 'දවටගහවත්ත' යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විස්න සාදන ලද වර්ෂ 2000 ක්වූ මැයි මස 06 වන දිනැති අංක 1626 දරන පිඹුරේ ලොට් 3ඩී (අඩි 15ක් පළල මාර්ගය සඳහා වෙන් කර ඇති) වශයෙන් සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල. එකී ලොට් 3ඩී කැබැල්ලට මායිම්, උතුරට ලොට් 2, 3ඒ සහ 3බී ද නැගෙනහිරට රුක්මන් සේනාරත්න ගේ ඉඩම් ද දකුණට ලොට් 3සී ද සහ බස්නාහිරට ලොට් 3ඊ, 2, 3ඒ සහ 3බී ද වන ඉහත කී අංක 1626 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහහතරයි දශම හතක් (අ 0-රු 0-පර්. 14.7) වේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කටුනායක-සීදුව මහ නගර සභා සීමාව ඇතුළත අලුත්කුරු කෝරළේ දාසිය පත්තුව කොට්ඨාශ අංක 11, අමන්දොලුව ග්‍රාමයේ පිහිටි "දවටගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විසින් සාදන ලද වර්ෂ 2000 ක් වූ මැයි මස 06 දිනැති අංක 1626 දරන පිඹුරේ ලොට් 3ඊ (අඩි 20ක් පළල මාර්ගය සඳහා වෙන් කර ඇති) වශයෙන් සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල, එකී ලොට් 3ඊ කැබැල්ලට මායිම්, උතුරට : ලොට් 2 ද. නැගෙනහිරට : ලොට් 3ඩී ද, දකුණට : කුඹුර ද සහ බස්නාහිරට : මාර්ගය (පුද්ගලික) ද වන ඉහත කී අංක 1626 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහහතරයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 14.2) වේ.

එම ලොට් 3ඩී සහ 3ඊ කැබලි මෙහි පහත දැක්වෙන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඒවා වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කටුනායක-සීදුව මහ නගර සභා සීමාව ඇතුළත අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, කොට්ඨාශ අංක 11, අමන්දොලුව ග්‍රාමයේ පිහිටි දවටගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු පී .ඩී. එන්. පීරිස් විසින් සාදන ලද වර්ෂ 2000 ක් වූ මැයි මස 06 වැනි දිනැති අංක 1626 දරන පිඹුරේ ලොට් 3 වශයෙන් සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල, එකී ලොට් 3 කැබැල්ලට මායිම්, උතුරට : ලොට් 2 සහ ශ්‍රියානි ජයසූරියගේ ඉඩම ද, නැගෙනහිරට : රුක්මන් සේනාරත්න, ඩැනියෙල් පෙරේරා සහ කේ. ජේ. එල්. පෙරේරාගේ ඉඩම් ද, දකුණට : හෙන්රි සිල්වා, පැට්‍රික් සිල්වා සහ ඒ. එච්. පීටර් මයිකල් යන අයගෙ ඉඩම් සහ කුඹුර ද සහ බස්නාහිරට : කුඹුර සහ මාර්ගය (පුද්ගලික) ද වන ඉහත කී අංක 1626 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් විස්සයි දශම හතක් (අ. 1, රූ. 1, පර්. 20.7) වේ.

මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්,

අංක 76, යෝර්ක් වීදිය,
කොළඹ 01.

08-742

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ණය ගිණුම් අංක : 106188 සහ 106189.

2004 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. වික්‍රමසිංහ විසින් සහතික කරන ලද 1994 සැප්තැම්බර් මස 23 වැනි දින අංක 436 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමට ලියන ලද්දා වූ ද, බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 5, ද ෆොන්සේකා පාරේ, අංක 2බී යන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන සමාගම් ආඥාපනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වූ සෙරමෙක්ස් ලිමිටඩ් ණයකරු හැටියට ද, පැහැර ඇති හෙයින් (මෙහි 1 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම ද)

සහ එසේම 1995 පෙබරවාරි මස 01 වැනි දින අංක එෆ්/ සී/95/02 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි නමට ලියන ලද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 5, ද ෆොන්සේකා පාරේ, අංක 2බී යන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන ශ්‍රී ලංකා ජනරජයේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වූ සෙරමෙක්ස් ලිමිටඩ් ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් (මෙහි 2 වන උපලේඛණයේ සවිස්තරව විස්තර කරන ලද යන්ත්‍රෝපකරණ ද)

සහ එසේම 1996 දෙසැම්බර් මස 18 වැනි දින අංක එෆ්/සීසී/96/176 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි නමට ලියන ලද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් වේීම කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ, අංක 421/5 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන සමාගම් ආඥා පනත යටතේ ශ්‍රී ලංකා ජනරජයේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වූ සෙරමෙක්ස් ලිමිටඩ් ණය කරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් (මෙහි 3 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද වෙළෙඳ භාණ්ඩ තොග) ද,

සහ එසේම එකී බැඳුම්කරය යටතේ මහා බ්‍රිතාන්‍ය පවුම් එකසිය හතලිස් හතර දහස් හයසිය හතලිස් එකයි පැන්ස එකක් (පීබීපී 144,641.01) (හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල් වලින්) මුදලක් 2004 පෙබරවාරි මස 20 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී මහා බ්‍රිතාන්‍ය පවුම් එකසිය හතලිස් හතර දහස් හයසිය හතලිස් එකයි පැන්ස එකක (පීබීපී. 144,641.01)

(හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල් වලින්) 2004 පෙබරවාරි මස 21 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට ජීබීපී 105,201.13 (හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල් වලින්) ක මුදල මත ලන්ඩන් ඉන්ටර් බැන්ක් ඔෆ් රේට් හි 4%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදලත් අඩුකොට එකී අංක 436, එප්සී/95/02 සහ එප්සීසී/96/176 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස් කොට ඇත්තාවූ ද, මෙහි 1 වන, 2 වන සහ 3 වන උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇත්තාවූද, දේපළ සහ පරිශ්‍රයන්, යන්ත්‍රෝපකරණ සහ වෙළඳ භාණ්ඩ තොග කොළඹ 12, හල්ප්ස්ඩෝප් වීදියේ අංක 99, එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### ඉහත කී 01 වැනි උපලේඛනය

බලයලත් මානක ඩී. එච්. ඇතුලත්මුදලි විසින් 1993 අගෝස්තු මස 03 වැනි දින සාදන ලද අංක 2599සී දරන මිණුම් පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කුඹුකේ පත්තු රයිගම් කෝරළේ, උඩව දකුණ පිහිටි මිදෙල්ලමුලහේන වතුයාය කියන ඉඩමේ (අංක 2599 දරන පිඹුරේ ලොට් 5 ලෙස ලකුණු කරන ලද ඉඩමෙන් බෙදා වෙන් කරන ලද කොටසක් වන) ගොඩනැගිලි සහ සියළු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 5බී ලෙස ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 2599 දරන පිඹුරේ ලොට් 5 දරන ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : පාර ද, දකුණට : එම ඉඩමේ අංක 2599 දරන පිඹුරේ ලොට් 04 ද සහ බස්නාහිරට : එකී අංක 2599 දරන පිඹුරේ ලොට් 5 දරන කොටතේ ඉතිරි කොටස ද යන මායිම් තුළ අක්කර එකක් (අ. 01, රූ. 00, පර්. 00) ක් විශාල ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 116/268 යටතේ ලියාපදිංචිව ඇත.

### ඉහත කී 02 වන උපලේඛනය

සමාගම සතු පහත සඳහන් යන්ත්‍රෝපකරණ ශ්‍රී ලංකා ජනරජයේ බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ මිදෙල්ලමුලහේන වතුයායේ කර්මාන්ත ශාළාවේ තැන්පත් කොට ඇති සහ තිබෙන සහ වෙත ගෙන ආයුතු අතර දැනට හෝ මින්මතු සමාගම විසින් වෙනත් පරිශ්‍රයක වෙළඳ ව්‍යාපාර කටයුතු කරගෙන යන්නේ නම් පහත සඳහන් කරන ලද යන්ත්‍රෝපකරණ සවිකල යුතු ය.

| *යන්ත්‍රෝපකරණ/ භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* | *නිෂ්පාදිත/නිමකල රට* | *මොඩල් අංකය* | *සිරියල් අංක* |
|---|---|---|---|---|
| කිලින් (පෝරණු) | 01 | මිආමිකිල්න් | එච්සී-100 | 1057 |
| වායු ටැංකි | 01 | යූඑස්ඒ | ඒකිව්7-ඒපී | 429319 |
| ඉටිකලවම් භාණ්ඩ | 02 | ලෙහෙමන් | 6000 බී | 6060බී51122-794<br>6060 බී73122 - 294 |
| පොම්ප | 01 | ඒආර්ඕ/යූඑස්ඒ | 6661503526 | ඊ 925 4010 |
| මොඩලින් වීල් | 01 | ලෝකල් | - | - |
| ක්ලිපොන් මීටර් | 01 | කයෝපිටියු/ජපානය | 2608 | 356184 |
| කොම්ප්‍රෙශර්ස් | 02 | ඇග්ලෝ/යූඑස්ඒ | ජී 758-80වී | 3052492392<br>305249239 |
| ටර්නිංග් විල්ස් | 13 | බේලි/යුකේ | - | - |
| | 01 | ඩන්කන්/යූඑස්ඒ | - | - |
| | 01 | ලෝකල් | - | - |
| මෝල්ඩ් මේකින් ටූල්ස් | 04 | ලෝකල් | - | - |
| ස්ප්‍රේයර් | 01 | බින්ක්ස්/යුකේ | එල්ජී-100 | ආර් 686 49-11 |
| ප්ලාස්ටර් මික්ස | 01 | ලෙහෙමන්/යූඑස්ඒ | - | - |
| කොම්පියුටර් ප්‍රින්ටර් | 01 | එප්සන් | එල්කිව් 1170 | |
| පැක්ස් මැෂින් | 01 | කැනන් | ටී 40 | - |
| කොමර්ෂල් ඩම්පිංග් ඇන්ඩ් කාස්ටින් මැෂින් | 01 | ලෙමන්/යූඑස්ඒ | - | - |
| සීලිං පැන්ස් (කාස්ටිං බේෂි) | 42 | නැෂනල්/ජපානය | – | – |
| පැලට් ට්‍රක් | 01 | ලෝකල් | – | – |
| සීලිං පැන්ස් | 16 | - | - | - |
| කාස්ටිං බෙන්චස් | 16 | - | - | - |
| පෝටබල් ජෙනරේටර් | 01 | - | - | - |
| හැම ඩ්‍රිල් බෙන්ච් වයිස් | 01 | ලෝකල් | - | - |
| ලැබෝර්ටරි කිල්න් | 01 | ඩන්කන්/යූඑස්ඒ | එල්ටී 3කේ | 0008-88 |
| යුනිවර්සල් විස්කොම්ටර් | 01 | - | - | - |
| පෝටබල් මික්සර් | 01 | - | - | - |
| ලැබොරටරි ස්කෙල් | 01 | - | - | - |

### ඉහත කී 3 වන උපලේඛනය

(ශ්‍රී ලංකා ජනරජයේ බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කය තුළ) හොරණ, මිදෙල්ලමුල්ලහේන වතුයාය පරිශ්‍රයේ දැනට තැන්පත් කොට ඇති සහ තිබෙන තීන්ත වර්ග සවිකරන ලද භාණ්ඩ, ග්ලේස්, එල්පී ගෑස්, ඉටි, මෝල්ඩ්ස් සහ අමතර කොටස් වැඩකරමින් යන සහ නිමකල භාණ්ඩ සහ සියළු චංචල දේපළ සහ සමාගම සතු ව්‍යාපාර කටයුතු සඳහා රැස්කොට ඇති සියල්ල තනිව හෝ සමූහ වශයෙන් ද සහ ගබඩා කොට ඇති භාණ්ඩ අතුරින් වරින්වර වෙළෙඳ ගණුදෙනු සඳහා භාවිතා කරන භාණ්ඩ නැවත ගබඩා ගත කරනවා ද, එසේ නැතිනම් ණයකරු පදිංචි ස්ථානයේ තැන්පත් කර තබා නැවත වෙළඳාම පිණිස රැගෙන යන්නේ ද, එසේත් නැතිනම් එම ස්ථානයේදී ම වෙළෙඳ කටයුතු කරනවාද යන්න නිගමනය කළ යුතුව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

08-769

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ණය ගිණුම් අංකය : 242080.

2007 අප්‍රේල් මස 04 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, ජේ. ආර්. ගමගේ විසින් සහතික කරන ලද 2005 ජුනි මස 07 වැනි දින අංක 2930 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි නමට ලියන ලද්දාවූ ද, බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රජිව් ජෝෂප් සෙබස්තියන් හෙවත් රජීව් ජෝෂප් සෙබස්තියන් තුරෙයිරාජා ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිලක්ෂ හැත්තෑහතර දහස් අටසිය අසූහතරයි ශත තිස් නවයක (රු. 20,74,884.39) මුදලක් 2007 පෙබරවාරි මස 25 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් විසිලක්ෂ හැත්තෑහතර දහස් අටසිය අසූ හතරයි ශත තිස් නවයක (රු. 20,74,884.39) මුදලට 2007 පෙබරවාරි මස 26 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 19,03,273.96ක මුදල මත 15%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 2930 දරන උකස් බැඳුම්කරය මගින් කෝමර්ෂල් බැන්ක් ඔප් සිලෝන් ලිමිටඩ් වෙත උකස් කෙට ඇත්තා වූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර අත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ප්ස්ඩෝෆ් වීදියේ, අංක 99හි බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### ඉහත සඳහන් කළ උපලේඛනය

බලයලත් මානක එස්. ලියනගේ විසින් 2000 ඔක්තෝබර් මස 2 වැනි දින සාදන ලද අංක 177 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු හේවාගම් කෝරළේ, බත්තරමුල්ල උප කාර්යාලයේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ තලංගම උතුර පිහිටි දෙල්ගහවත්ත, අලුබෝගහලන්ද, බටලාදෙනියකැලේ, බටලාවත්තේදෙනිය, බුන්වැල්ලේ, ගොඩැල්ලකැලේ, හොරගහමණ්ඩියකැලේ, බටදෙනියකැලේ, ගොරකගහවත්ත, ඇතුන්කැදෙනි, හොරගහවත්ත, නුගගහවත්ත, අලුබෝගහදෙනිය සහ අලුබෝගහදෙනිය ඕවිට සහ දැනට ශාන්ත තෝමස් වතුයාය (කොටසක්) නමින් හැඳින්වෙන අතර කුරුදුවත්ත පාරේ වරිපනම් අංක 65/23පී දරන ඉඩමේ ගසකොළ, වගාවන් ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 20 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ඇල ද, නැගෙනහිරට : ලොට් 21 ද, දකුණට : මෙහි (අඩි 20-30 පළල පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් 42 ද සහ බස්නාහිරට : මෙහි ලොට් 19 ද යන මායිම් තුළ අංක 177 දරන පිඹුර පරිදි පර්චස් හයක් (අ. 0, රූ. 0, පර්. 6) ප්‍රමාණයෙන් යුත් ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 1280/267 දරන වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඔස්සේ සහ දිගේ ගමන් කිරිමේ මාර්ග අයිතිය ද සමඟ වේ.

1. බලයලත් මානක එස්. ලියනගේ විසින් 2000 ඔක්තෝබර් මස 02 වැනි දින සාදන ලද අංක 177 දරන පිඹුරේ පෙන්වා ඇති (අඩි 20 පළල පාරක් සඳහා වෙන්කොට ඇති) ලොට් 42 දරන දෙල්ගහවත්ත, අලුබෝගහලන්ද, බටලාදෙනියකැලේ, බටලාවත්තේදෙනිය, බුන්වැල්ලේ-ගොඩැල්ලකැලේ, හොරගහමණ්ඩියකැලේ, බටදෙනියකැලේ, ගොරකගහවත්ත, ඇතුන්කැදෙනිය, හොරගහවත්ත, නුගගහවත්ත, අලුබෝගහදෙනිය සහ අලුබෝගහදෙණිය ඕවිට, සහ දැනට ශාන්ත තෝමස් වතුයාය (කොටසක්) නමින් හැඳින්වෙන ඉඩම එකී තලංගම දකුණ පිහිටා ඇති එකී ලොට් 42 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : (පාරක් සඳහා වෙන් කොට ඇති) ලොට් 43 ද, (අගලක් සඳහා වෙන් කොට ඇති) ලොට් 14 සිට ලොට් 42 දක්වා ද, මෙහි ලොට් 39, 33 සහ 34න් ද, නැගෙනහිරට : මෙහි ලොට් 14, 24, 26, 39, 34 සහ 38 සහ අංක 1758 දරන පිඹුරේ ලොට් 2 ද (අගලක්) සහ ජේ. ඒ. එස්. එස් වික්‍රමසිංහගේ දේපළ ද, දකුණට : ලොට් 23, 26, 27, 38 ඇල මාර්ගය ද,. අංක 1942 දරන පිඹුරේ පෙන්වා ඇති (අඩි 30ක පළල පාරක් සඳහා වූ) ලොට් ඒ5ඊ ද සහ බස්නාහිරට : ලොට් 1, 11, 27, 33, 39 සහ 40 ද යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් තිස් නවයයි දශම අටක් (අ. 0, රූ. 1, පර්. 39.8) ප්‍රමාණයෙන් යුත් ඉඩම එකි අංක 177 දරන පිඹුර පරිදි හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 1280/42 වෙළුම/පිටුව යටතේ ලියාපදිංචි කර ඇත.

2. බලයලත් මානක එස්. ඩී. ලියනසූරිය විසින් 1981 ජනවාරි මස 31 වැනි දින සාදන ලද අංක 2184 දරන පිඹුරේ පෙන්වා ඇති (අඩි 20 පළල පාරක් සඳහා වෙන්කොට ඇති) ලොට් ඒ9 දරන දෙල්ගහවත්ත, අලුබෝගහලන්ද, බටලාදෙනියකැලේ, බටලාවත්තේදෙනිය, බුන්වැල්ලේගොඩැල්ලකැලේ, හොරගහමණ්ඩියකැලේ, බටදෙනියකැලේ, ගොරකගහවත්ත, ඇතුන්කැදෙනිය, හොරගහවත්ත, නුගගහවත්ත, අලුබෝගහදෙනිය සහ අලුබෝගහදෙණීය ඕවිට, සහ දැනට ශාන්ත තෝමස් වතුයාය (කොටසක්) නමින් හැඳින්වෙන ඉඩම එකී තලංගම දකුණ පිහිටා ඇති එකී ලොට් ඒ9 ට මායිම්, උතුරට : ලොට් ඒ3 ද, නැගෙනහිරට : ලොට් ඒ4 සහ බී. ජයවර්ධන මහත්මියට අයිති ඉඩම ද, දකුණට : මහකුරුඳුවත්ත පාර ද, බස්නාහිරට : ලොට් ඒ5 ද යන මායිම් තුළ අංක 2184 දරන පිඹුර පරිදි රූඩ් එකයි පර්චස් හයක් (අ. 0, රූ. 1, පර්. 6ක්) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ පී 860/233 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

3. බලයලත් මානක එස්. ඩී. ලියනසූරිය විසින් 1981 ජනවාරි මස 31 වැනි දින සාදන ලද අංක 2184 දරන පිඹුරේ පෙන්වා ඇති (අඩි 10 පළල පාරක් සඳහා වෙන්කොට ඇති) ලොට් ඒ5බී දරන දෙල්ගහවත්ත, අලුබෝගහලන්ද, බටලාදෙනියකැලේ, බටලාවත්තේදෙනිය, බුන්වැල්ලේ ගොඩැල්ලකැලේ, හොරගහමණ්ඩියකැලේ, බටදෙනියකැලේ, ගොරකගහවත්ත, ඇතුන්කැදෙනිය, හොරගහවත්ත, නුගගහවත්ත, අලුබෝගහදෙනිය සහ අලුබෝගහදෙණීය ඕවිට, සහ දැනට ශාන්ත තෝමස් වතුයාය (කොටසක්) නමින් හැඳින්වෙන ඉඩම එකී තලංගම දකුණ පිහිටා ඇති එකී ලොට් ඒ5බී දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් ඒ3 ද, නැගෙනහිරට : (අඩි 20 පළල පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් ඒ9 ද, දකුණට : මහකුරුඳුවත්ත පාර ද සහ බස්නාහිරට : ලොට් ඒ5ඒ ද යන මායිම් තුළ අංක 2184 දරන පිඹුර පරිදි පර්චස් විසිඑකයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 21.6) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 539/294 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

4. බලයලත් මානක ඒ. ඊ. විජේසූරිය විසින් 1983 මාර්තු මස 14 වැනි දින සාදන ලද අංක 1903 දරන පිඹුරේ පෙන්වා ඇති (අඩි 30 පළල පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් ඒ51 දරන දෙල්ගහවත්ත, අලුබෝගහලන්ද, බටලාදෙනියකැලේ, බටලාවත්තේදෙනිය, බුන්වැල්ලේගොඩැල්ලකැලේ, හොරගහමණ්ඩියකැලේ, බටදෙනියකැලේ, ගොරකගහවත්ත, ඇතුන්කැදෙනිය, හොරගහවත්ත, නුගගහවත්ත, අලුබෝගහදෙනිය සහ අලුබෝගහදෙණීය ඕවිට, සහ දැනට ශාන්ත තෝමස් වතුයාය (කොටසක්) නමින් හැඳින්වෙන ඉඩම එකී තලංගම දකුණ පිහිටා ඇති එකී ලොට් ඒ51 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 2184 දරන පිඹුරේ ලොට් ඒ2 සහ ලොට් ඒ5ඒ සිට ඒ5ඩී දක්වා ද, නැගෙනහිරට : (අඩි 10 පළල පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් ඒ5එච් ද සහ ලොට් ඒ5ඒ ද, දකුණට : ලොට් ඒ5එෆ් සහ ඒ5ඊ ද සහ බස්නාහිරට : අංක 2184 දරන පිඹුරේ ලොට් ඒ6 ද (අංක 2184 දරන පිඹුරේ ලොට් ඒ6 සහ ඒ2 වඩාත් නිවැරදිය) මෙකී මායිම් තුළ අංක 1903 දරන පිඹුරෙහි රූඩ් එකයි පර්චස් එකයි දශම හයයි හතරක් (අ. 0, රූ. 1, පර්. 1.64) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1117/217 වෙළුමේ/පිටුවේ ලියාපදිංචිව ඇත.

5. බලයලත් මානක සිරි ඩී. ලියනසූරිය විසින් 1977 දෙසැම්බර් මස 16 වැනි දින සාදන ලද අංක 6790ඒ දරන පිඹුරේ පෙන්වා ඇති (අඩි 30 පළල පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් ඒ5ඊජේ දරන දෙල්ගහවත්ත, අලුබෝගහලන්ද, බටලාදෙනියකැලේ, බටලාවත්තේදෙනිය, බුත්වැල්ලේ-ගොඩැල්ලකැලේ, හොරගහමණ්ඩියකැලේ, බටදෙනියකැලේ, ගොරකගහවත්ත, ඇතුන්කැදෙනිය, හොරගහවත්ත, නුගගහවත්ත, අලුබෝගහදෙනිය සහ අලුබෝගහදෙණිය ඕවිට, සහ දැනට ශාන්ත තෝමස් වතුයාය (කොටසක්) නමින් හැඳින්වෙන ඉඩම එකී තලංගම දකුණ පිහිටා ඇති එකී ලොට් ඒ5ඊජේ දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : එම ඉඩමේම කොටසක් වන ලොට් ඒ2 ද, නැගෙනහිරට : එම ඉඩමේ කොටසක් සහ පාර ද, දකුණට : බලයලත් මානක ඒ. ඊ. විජේසූරිය විසින් සාදන ලද අංක 4105 දරන පිඹුරේ ලොට් 1 සහ ලොට් ඒ5පී, ඒ5යූ සහ ඒ5කිව් සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් ඒ6 සහ ඒ2 ද යන මායිම් තුළ අංක 6790ඒ දරන පිඹුර පරිදි රූඩ් එකයි පර්චස් දෙකයි දශම පහක් (අ. 0, රූ. 1, පර්. 2.5) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 1196/216 වෙළුමේ/පිටුවේ ලියාපදිංචිව ඇත.

6. බලයලත් මානක ජේ. එම්. ඩබ්ලිව්. සමරනායක විසින් 2001 ජනවාරි මස 17 වැනි දින සාදන ලද අංක 1289/ඒ දරන පිඹුරේ පෙන්වා ඇති ( පාරක් සඳහා වෙන්කොට ඇති) ලොට් 19 දරන දෙල්ගහවත්ත, අලුබෝගහලන්ද, බටලාදෙනියකැලේ, බටලාවත්තේදෙනිය, බුත්වැල්ලේගොඩැල්ලකැලේ, හොරගහමණ්ඩියකැලේ, බටදෙනියකැලේ, ගොරකගහවත්ත, ඇතුන්කැදෙනිය, හොරගහවත්ත, නුගගහවත්ත සහ අලුබෝගහදෙණිය ඕවිට, සහ දැනට ශාන්ත තෝමස් වතුයාය (කොටසක්) නමින් හැඳින්වෙන ඉඩම එකී තලංගම දකුණ පිහිටා ඇති එකී ලොට් 19ට මායිම්, උතුරට : ලොට් 1-9 සහ ලොට් 18 ද, නැගෙහිරට : අංක 3987 දරන පිඹුරේ ලොට් ඒ ද අංක 6322 දරන පිඹුරේ ලොට් 1සී3 ද සහ අංක 6232 දරන පිඹුරේ ලොට් 1බී ද, දකුණට : ලොට් 10, 12-17 සහ පාර සහ බස්නාහිරට : ලොට් 10, 11, 17, 18 සහ අංක 1758 දරන පිඹුරේ ලොට් 2 (අගල ද) යන මායිම් තුළ අංක 1289/ඒ දරන පිඹුර පරිදි පර්චස් විසිහයයි දශම හතරයි හතක් (අ. 0, රූ. 0, පර්. 26.47) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1420/239 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචි වී ඇත.

7. බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් 1993 සැප්තැම්බර් මස 01 වැනි දින සාදන ලද අංක 6232 දරන පිඹුරේ පෙන්වා ඇති (පාරක් සඳහා වෙන් කොට ඇති) ලොට් 1බී දෙල්ගහවත්ත, අලුබෝගහලන්ද, බටලාදෙනියකැලේ, බටලාවත්තේදෙනිය, බුත්වැල්ලේගොඩැල්ලකැලේ, බටදෙනියකැලේ, ගොරකගහවත්ත, ඇතුන්කැදෙනිය, හොරගහවත්ත, නුගගහවත්ත සහ අලුබෝගහදෙණිය ඕවිට, සහ දැනට ශාන්ත තෝමස් වතුයාය (කොටසක්) නමින් හැඳින්වෙන ඉඩම එකී තලංගම දකුණ පිහිටා ඇති එකී ලොට් 1බී දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1සී ද, නැගෙනහිරට : ලොට් 1සී ද, දකුණට : අඩි 30ක් පළල පාර ද සහ බස්නාහිරට : ලොට් 1ඒ ද යන මායිම් තුළ අංක 6232 දරන පිඹුර පරිදි පර්චස් එකයි දශම පහක් (අ. 0, රූ, 0, පර්. 1.5) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1420/240 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

8. බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් 1993 නොවැම්බර් මස 25 වැනි දින සාදන ලද අංක 6322 දරන පිඹුරේ පෙන්වා ඇති (පාරක් සඳහා වෙන් කොට ඇති) ලොට් 1සී3 දරන දෙල්ගහවත්ත, අලුබෝගහලන්ද, බටලාදෙනියකැලේ, බටලාවත්තේදෙනිය, බුත්වැල්ලේගොඩැල්ලකැලේ, හොරමණ්ඩියකැලේ, බටදෙනියකැලේ, ගොරකගහවත්ත, ඇතුන්කැදෙනිය, නුගගහවත්ත, අලුබෝගහදෙනිය සහ අලුබෝගහදෙණිය ඕවිට, සහ දැනට ශාන්ත තෝමස් වතුයාය (කොටසක්) නමින් හැඳින්වෙන ඉඩම එකී තලංගම දකුණ පිහිටා ඇති එකී ලොට් බී දරන කොටසට මායිම්, උතුරට : ලොට් 1සී2 ද, නැගෙනහිරට : ලොට් 1සී1 ද, දකුණට : අංක 6232 දරන පිඹුර පරිදි පර්චස් එකයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 1.5) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 952/200බී වෙළුමේ/පිටුවේ ලියාපදිංචිව ඇත.

9. බලයලත් මානක ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන විසින් 1994 සැප්තැම්බර් මස 29 වැනි දින සාදන ලද අංක 3987 දරන පිඹුරේ පෙන්වා ඇති (පාරක් සඳහා වෙන් කොට ඇති) ලොට් බී දරන දෙල්ගහවත්ත, අලුබෝගහලන්ද, බටලාදෙනියකැලේ, බටලාවත්තේදෙනිය, බුත්වැල්ලේ-ගොඩැල්ලකැලේ, හොරගහමණ්ඩියකැලේ, බටදෙනියකැලේ, ගොරකගහවත්ත, ඇතුන්කැදෙනිය, හොරගහවත්ත, නුගගහවත්ත, අලුබෝගහදෙනිය සහ අලුබෝගහදෙණිය ඕවිට, සහ දැනට ශාන්ත තෝමස් වතුයාය (කොටසක්) නමින් හැඳින්වෙන ඉඩම එකී තලංගම දකුණ පිහිටා ඇති එකී ලොට් 'බී' දරන කොටසට මායිම්, උතුරට : ලොට් ඒ ද, නැගෙනහිරට : ලොට් ඒ ද, දකුණට : අඩි 30ක් පළල පාර ද සහ බස්නාහිරට : (අංක 6232 දරන පිඹුර පරිදි අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කොට ඇති) ලොට් 1බී ද යන මායිම් තුළ අංක 3987 දරන පිඹුර පරිදි පර්චස් බිංදුවයි දශම හතයි තුනක් (අ. 0, රූ. 0, පර්. 0.73) ප්‍රමාණයේ ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1420/244 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

08-771

---

## කොමර්පල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ගිණුම් අංකය : 1900461001.
ණය ගිණුම් අංකය : 137275.

2007 මැයි මස 04 වන දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් අයි. එච්. බී. ඩී. විජේකෝන් විසින් සහතික කරන ලද 1997 ඔක්තෝබර් මස 11 වන දින අංක 3482, බැඳුම්කරයද කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ආර්. ජයවර්ධන විසින් සහතික කරන ලද 1998 අප්‍රේල් මස 20 වන දින අංක 1820, 1998 සැප්තැම්බර් මස 24 වන දින අංක 1933, 2000 ජූලි මස 08 වන දින අංක 2678, 2001 ජූලි මස 12 වන දින අංක 3061 සහ 2003 සැප්තැම්බර් මස 27 වන දින අංක 4062 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කරයන් යටතේ හෙන්නායක මුදියන්සේලාගේ පොඩිමැණිකේ ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් දශලක්ෂ දෙදහස් එකසිය හැටහයයි ශත හැටදෙකක (රු. 1,002, 166.62) මුදලක් 2006 ජූනි මස 30 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දශලක්ෂ දෙදහස් එකසිය හැට හයයි ශත හැට දෙකක (රු. 1,002,166.62) මුදල හා 2006 ජූලි මස 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 9,05,627.75ක මුදලක් සඳහා වාර්ෂිකව 18% බැගින් වූ පොලියද සහ රු. 88,282.48ක මුදලක් සඳහා වාර්ෂිකව 17% බැගින් වූ පොලියද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එයද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 3482,1820 - 1933, 2678 - 3061 හා 4062 බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපල හා පරිශ්‍රය

මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ අංක 83/5 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කරගනී.

උපලේඛනය

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුර කන්දපල්ල කෝරලේ ගලේවෙල පිහිටි හතමුණේ කුඹුර දැන් වත්ත නැමැති ඉඩමට බලයලත් මානක එස්. රංචාගොඩ විසින් 1996 ජූලි මස 07 වන දින මැන සාදන ලද අංක 3592 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කරන ලද ලොට් 2ට මායිම් එනම් උතුරට: ඉහත කී පිඹුරේ සඳහන් ලොට් 01න් හෝ වරිපනම් අංක 152 දරන දේපලෙන්ද, නැගෙනහිරට : එම ඉඩමේ කොටසකින් හෝ වරිපනම් අංක 144/1 දරන දේපලෙන්ද, දකුණට : ඉහත කී පිඹුරේ ලොට් 3න් හෝ වරිපනම් අංක 148 දරන දේපලෙන්ද හා බස්නාහිරට : දඹුල්ල කුරුණෑගල මහා මාර්ගයෙන්ද, යන මෙකී මායිම් තුල පර්චස් තුනයි දශම හතරක් (0අ, 0 රූ. 3.4 පර්.) විශාල ඉඩම හා එහි තුල පිහිටි වරිපනම් අංක 150 දරන දේපල හා අනෙකුත් සියලු දේ.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 411/186 වෙළුම/ පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

08-772/1

---

කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ණය ගිණුම් අංකය : 248031.

2007 මැයි මස 04 වන දින පැවැත්වූ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ආර්. ජයවර්ධන විසින් සහතික කරන ලද 2005 ජූලි මස 13 වන දින අංක 5007 දරන කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් නමින් වූ බැඳුම්කරය යටතේ හෙන්නායක මුදියාන්සේලාගේ පොඩිමැණිකේ ණයකරු වශයෙන් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් දහතුන්ලක්ෂ දොළොස්දාස් දෙසිය හතලිස් හතයි ශත හැට අටක් (රු. 1,312,247.68) මුදලක් 2007 ජනවාරි මස 18 වන දින වන විට කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දහතුන්ලක්ෂ දොළොස්දාස් දෙසිය හතලිස් හතයි ශත හැට අටක (රු. 1,312,247.68) ක මුදල හා 2007 ජනවාරි මස 19 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,134,750 ක මුදලක් සඳහා වාර්ෂිකව 17% බැගින් වූ පොලියද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එයද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 5007 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපල හා පරිශ්‍රය මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ අංක 83/ 5 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂමණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

ඉහත කී උපලේඛනය

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුර කන්දපල්ල කෝරලේ දඹවටවාන පිහිටි නිකලන්දේ හේන *නොහොත්* කුඹුක්ගහමුල හේන සහ නිකලන්දේ යාය දැන් දුල් දුල් හාල් මෝල නැමැති රූඩ් තුනයි පර්චස් තිස් අටක් (0අ., 03රූ., 38ප.) විශාල බෙදා වෙන් කරන ලද ඉඩමට මාතලේ බලයලත් මානක කේ. එස්. සමරසිංහ විසින් 1980 දෙසැම්බර් මස 13 වන දින මැන සාදන ලද අංක 1265 දරන පිඹුර ප්‍රකාර මායිම් එනම් උතුරට : පන්සල් වත්ත *නොහොත්* බී. ඩී. ධනපාලට අයත් පිංකුඹුරේහේනෙන්ද නැගෙනහිරට : ගලේවෙල සිට කලාවැව දක්වා දිවෙන මහ මාර්ගයේ මාර්ග පරවශතාවයෙන් ද දකුණට : ජී. එස්. එම්. සලීම්ට අයත් බදුරියා හාල් මෝලෙන්ද හා බස්නාහිරට : ජී. සයිමන් සිංඤ්ඤෝ විසින් භුක්ති කියන ලද නවතේ කුඹුරෙන්ද, යන මෙකී මායිම් තුල පිහිටි ගස්, වගාවන් ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 354/75 වෙළුම/ පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

08-772/2

---

මහජන බැංකුව - යක්කල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.04.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2005.12.28 දිනැති අංක 10723 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, බෝදියා දේවගේ මලින් රත්නායක යන අය විසින් පැහැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් පන්ලක්ෂ නමදහස් දෙසියහතලිස්හතරයි ශත තිහ (රු. 509,244.30) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 2006.09.29 දින සිට වර්ෂයකට 16.75% බැගින් රුපියල් පන්ලක්ෂ නමදහස් දෙසියහතලිස් හතරයි ශත තිහ (රු. 509,244.30) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පන්ලක්ෂ නමදහස් දෙසියහතලිස්හතරයි ශත තිහ (රු. 509,244.30) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 10723 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන්

ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරි ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ ඌරුවල පිහිටි හොරගහවත්ත නැමැති ඉඩමට බලය ලත් මිනින්දෝරු යූ. එම්. ආරියසේන විසින් 1996.02.09 වන දින මැන සකස් කළ අංක 607 දරන පිඹුරේ ලොට් අංක 1 දරන කොටසට මායිම් උතුරට : අඩි පාර ද, නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර සහ එම්. පී. සුමනපාල සහ තවත් අයට අයත් ඉඩමද, දකුණට : ලොට් අංක 2 සහ 3 (ඔප්පුවට අනුව ලොට් අංක 2) ද, බස්නාහිරට : ලොට් අංක 3 සහ අඩිපාර ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සයි දශම නමය (අ. 0, රූ. 0, පර්. 20.9) ක විශාල පාර ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ. 815/181 ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන්කර ඇති කොටසේ (ලොට් 2) මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර (ගම්පහ).

2007 ක් වූ ජූලි මස 31 වැනි දින,
මහජන බැංකුව,
බටහිර 111 කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

08-789

---

## මහජන බැංකුව (පමුණුගම ශාඛාව)

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.19 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජිත ඒ ද සිල්වා විසින් සහතික කරන ලද 2004.06.03 දිනැති අංක 1375 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, ගමමැද ලියනගේ නිකුලස් ධම්මි කුමාර් පෙරේරා සහ ගමමැද ලියනගේ ශ්‍රියානි කුමුදිනි නිශාන්ති පෙරේරා යන අය විසින් පැහැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හත්ලක්ෂ දෙදහස් පන්සියහතළිස් පහයි ශත නමය (රු. 702,545.09) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 2005.08.03 දින සිට වර්ෂයකට 15.75% බැගින් රුපියල් හත්ලක්ෂ දෙදහස් පන්සිය හතළිස්පහයි ශත නමය (රු. 702,545.09) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හත්ලක්ෂ දෙදහස් පන්සියහතළිස්පහයි ශත නමය (රු. 702,545.09) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 1375 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරි ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ සීමාව තුල ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව නගර සභා සීමාව තුල (තලාහේන උප කාර්යාලය) දූන්ගල්පිටිය ගමෙහි වරිපනම් අංක 1141 පමුණුගම පාරේ (වම) පිහිටි බුළුගහවතුකැබැල්ල සහ බුළුගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. අයි. ප්‍රනාන්දු විසින් 1998.08.03 වන දින මැන සකස් කල අංක 4782 දරන පිඹුරේ ප්‍රකාර මායිම් උතුරට : පාරද, නැගෙනහිරට : කිංස්ලි ජයමාන්නට අයත් ඉඩමද, දකුණට : පී. ජේ. ජේ. පෙරේරාට අයත් ඉඩමද, බස්නාහිරට : පමුණුගම පාර ද, යන මායිම් තුල පිහිටි පර්චස් දහසයයි දශම හතරයි පහ (අ. 0, රූ. 0, පර්. 16.45) ක විශාල පාර ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී. 838/28හි ලියාපදිංචි කර ඇත.

එකී පිඹුරේ දැක්වෙන මාර්ග අයිතින්ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර (ගම්පහ).

මහජන බැංකුව,
බටහිර 111 කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

08-790

---

## මහජන බැංකුව (මාතර උයන්වත්ත ශාඛාව)

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 'ඩී' වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29'ඩී' වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.06.22 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී.එන්. රූබසිංහ විසින් සහතික කරන ලද, 2005.06.28 දිනැති 2363 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්,ලන්දෙ බඩල්ගේ ඥානසිරි යන අය විසින් පැහැර හැර ඇති බැවින්, එකී උකස්කර අංක 2363 යටතේ රුපියල් අට ලක්ෂ අසූ දහසක (රු. 880,000) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින්ද, 2005.12.04 දින සිට වර්ෂයකට සියයට දහ අටයි දශම දෙකයි පහ (18.25%) බැගින් රුපියල් අට ලක්ෂ අසූ දහසක (රු. 8,80,000) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොළිය සහ අදාල මහජන බැංකු පනතේ 29'එල්'වගන්තිය යටතේ අය කර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද

සමඟ, අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් අට ලක්ෂ අසූ දහසක (රු. 8,80,000) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 2363 දරන උකස්කරය යටතේ, එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තර

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළයේ, කඹුරුගමුව පිහිටි දිවියගල හේනේ කැබලි අංක 04 බෙදූ කැබලි අංක 4සී සඳහා 2004.11.01 දිනැති එම්. එල්. එම්. රශ්මී බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 2112 දරන පිඹුර ප්‍රකාරව බෙදූ කැබලි අංක 4 සී3 දරන ඉඩම් කැබැල්ල සඳහා නැවත 2004.11.02 දිනැති එම්. එල්. එම්. රශ්මී බලයලත් මිනින්දෝරු මහතා විසින් මැන සාදන ලද අංක 2112 ඒ දරණ පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කල අංක 4 සී 3 බී දරන කැබැල්ලට එම පිඹුර ප්‍රකාර මායිම්:

උතුරු නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 05 දරන කැබැල්ල ද, දකුණු නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 07 දරන කැබැල්ල ද, දකුණු බස්නාහිරට: මෙම ඉඩමේ අංක 4සී 3සී හා 4සී 3ඒ දරන කැබලි ද, උතුරු බස්නාහිරට : මෙම ඉඩමේ අංක 4 ඩී දරන අඩි 10ක් පළල පාර ද, යන මායිම් තුල පිහිටි රූඩ් එකයි, පර්චස් දහ හතරයි දශම බින්දුවයි අටක් (අක් 00 රූඩ් 01 පර්. 14.08) විශාල ඉඩම සහ එය තුළ පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදි සෑම සියළු දෙය ද, අංක 4ඩී සහ 4සී 3සී හි මාර්ග අයිතියද සමඟ වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඩී. 108 1/140 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු (මාතර).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 38/1ඒ,
පිට්ටනිය පාර,
මාතර.

08-791

---

## මහජන බැංකුව – ආයතනික බැංකු කටයුතු අංශය

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව 2007 ජූනි මස 22 වැනි දින පැවති රැස්වීමේදී ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුවේ වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එල්. එම්. නාරංගොඩ මිය විසින් සහතික කරන ලද අංක 1018 හා 2006 ජනවාරි මස 31 දින සහ අංක 1108 සහ 2006 ජූලි මස 06 දින දරන උකස් බැඳුම්කර මත නියමිත ගෙවීම් සීමාසහිත පෞද්ගලික සමාගමක් වන ඔන්රිල් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම පැහැර හැර ඇති බැවින් එකී බැඳුම්කර මත රුපියල් මිලියන දෙසීයක් (රු.20,00,00,000) වන මුදල මහජන බැංකුවට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත.

එකී රුපියල් මිලියන දෙසීයක් (රු.20,00,00,000) වන මුදල, එකී රුපියල් මිලියන දෙසීයක් (රු.20,00,00,000) වන මුදල සඳහා 2007.05.21 දින සිට විකිණීමේ දිනය දක්වා වර්ෂයකට (සියයට විසි තුනයි) 23% බැගින් තවදුරටත් පොළිය හා එකී මහජන බැංකු පනතේ 29ඵල් වගන්තිය යටතේ අයකල හැකි පිරිවැය හා වෙනත් මුදල් ද සමග එදින තෙක් ලැබී ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසුව අයකර ගැනීම සඳහා එකී අංක 1018 හා 1108 දරන බැඳුම්කර මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම සමාගම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ ඔවුන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### දේපල පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය, තුළ අළුත්කුරු කෝරළේ දූනගහ පත්තුවේ දිවුලපිටිය ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුලත කලුවයිරිප්පුව නැගෙනහිර පිහිටි 'දිසාගෙවත්ත' යනුවෙන් හැඳින්වෙන ඉඩමේ, සර්වේයර් ජෙනරාල් විසින් සාදන ලද අංක 2506 සහ 1978.02.03 දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර නිරූපනය කර ඇති උතුරට : මීගමුව - මීරිගම මහා මාර්ගය ; නැගෙනහිරට : ඩී. ඒ. තෙන්නකෝන්ට අයත් මිල්ලගහවත්ත ජල මාර්ගය හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම විසින් ඩබ්ලිව්. එච්. ජයකොඩිගෙන් පවරා ගන්නා ලද කුඹුරු සහ බස්නාහිරට එම් සමරපාලගේ මිල්ලගහවත්ත, වික්ටර් පෙරේරාගේ මිල්ලගහවත්ත හා ඇල්බට් ඇප්ලි පෙරේරාගේ මිල්ලගහවත්ත මායිම් වන එකී අංක 2506 දරන පිඹුර ප්‍රකාර අක්කර දහහතරයි රූඩ් එකයි පර්චස් තිස් අටක් (අක්කර 14, රූඩ් 01. පර් 38) විශාල බෙදාවෙන් කළ මුළු ඉඩම් කට්ටිය හා එහි පිහිටි ගොඩනැගිලි හා එහි පිහිටි සෑම සියලු දේත් වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 953/227 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කර ඇති එකී අංක 2506 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් නිරූපනය කර තිබෙන ඉඩම් කට්ටිය බලයලත් මිනින්දෝරු කේ. ඒ. ජී. අමරසිංහ විසින් සාදන ලද අංක 5906 හා 1990.05.10 දින දරන පිඹුර ප්‍රකාර පහත දැක්වෙන පරිදි විස්තර කෙරේ.

ඉහත සඳහන් කලුවයිරිප්පුව නැගෙනහිර පිහිටි 'දිසාගේවත්ත' නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඒ. ජී. අමරසිංහ විසින් සාදන ලද අංක 5906 හා 1990.05.10 දින දරන පිඹුරේ ලොට් 01, 02 හා 03 වශයෙන් ලකුණු කර නිරූපනය කර ඇති යාබද ඉඩම් කට්ටි තුනෙන් සැදුම්ලත් උතුරට : ප්‍රධාන පාර : නැගෙනහිරට : ඇල හා ඩී. ඒ. තෙන්නකෝන්ට අයත් මිල්ලගහවත්ත හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වෙත පවරා ඇති දිසාගේවත්ත කුඹුරු හා ඇල හා බස්නාහිරට : එම්. සමරපාල, වික්ටර් පෙරේරා සහ එල්. ඇල්බට් ඇෂ්ලි පෙරේරාට අයත් මිල්ලගහවත්ත මායිම් වන එකී අංක 5906 දරන පිඹුර ප්‍රකාර අක්කර දාහතරයි රූඩ් දෙකයි පර්චස් විසි එකයි දශම හතරක් (අක්කර 14, රූඩ් 2, පර්චස් 21.4) විශාල මුළු යාබද ඉඩම් කට්ටි තුන සහ එහි පිහිටි ගොඩනැගිලි හා අන් සියලු දේත් වේ.

එකී අංක 2506 දරන ලොට් 1 වශයෙන් නිරූපනය කර ඉහත විස්තර කර තිබෙන ඉඩම් කට්ටිය මැනදී කරන ලද මැනීමක් අනුව බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. මෙන්ඩිස් විසින් සාදන ලද අංක 3358 හා 2005 ජනවාරි 11 වැනි හා 12 වැනි දින දරන පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කර තිබේ.

බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. මෙන්ඩිස් විසින් සාදන ලද අංක 3358 හා 2005 ජනවාරි මස 11 වැනි හා 12 වැනි දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර තිබෙන බෙදා වෙන්කරන ලද සම්පූර්ණ ඉඩම් කට්ටිය වන බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ දූනගහ පත්තුවේ දිවුලපිටිය ප්‍රාදේශීය

සහාබල සීමාව තුළ කලුවයිරිප්පුව නැගෙනහිර පිහිටි 'දිසාගෙවත්ත' නමැති සහ දැනට ඩායිගු ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් හැඳින්වෙන බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කට්ටිය සහ එහි පිහිටි ගොඩනැගිලි සහ අන් සැමදේද සමග එකී ලොට් 1 ඉඩම් කට්ටියට මායිම්, උතුරට : මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පාර (මීගමුව සිට මීරිගමට) ද නැගෙනහිරට : ඩී. ඒ. තෙන්නකෝන් සහ තවත් අය හිමිකම්පාන ඉඩම සහ ඇල සහ ඇල දිගේ රක්ෂිතය ද, දකුණට : ඇල සහ ඇල දිගේ රක්ෂිතය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම හිමිකම් පාන 'දිසාගෙවත්ත' කුඹුර ද, බස්නාහිරට : ඇල, වික්ටර් පෙරේරා සහ තවත් අය හිමිකම් පාන ඉඩම සහ එම්. සමරපාල හිමිකම්පාන ඉඩම ද මායිම් වූ එකී අංක 3358 දරන පිඹුර ප්‍රකාර අක්කර දාහතරයි රූඩ් දෙකයි පර්චස් එකයි දශම බිංදුවක් (අ. 14, රූ. 2, පර්. 1.0) විශාල සම්පූර්ණ දේපල වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු,
(ආයතනික ණය - 02)

මහජනබැංකුව,
ආයතනික බැංකු අංශය,
අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

08-792

---

## මහජන බැංකුව – කොට්ටාව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.04.27 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. ඉඳුරුව මහත්මිය විසින් සහතික කරන ලද අංක 2363 සහ 2006 පෙබරවාරි මස 21 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම මද්දුම පටබැඳිගේ ප්‍රේම වසන්ත කුමාර ජයවර්ධන සහ කොඩිප්පිලි පටබැඳිගේ චමිලා දමයන්ති විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 2363 දරන බැඳුම්කරය මත රුපියල් විසිනව ලක්ෂ හැත්තෑ දහසක (රු.29,70,000) සහ රුපියල් තිස් අට ලක්ෂ හැත්තෑහය දහස් දෙසිය දහතුනයි ශත විසි එකක (රු.38,76,213.21) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් විසිනව ලක්ෂ හැත්තෑ දහසක (රු.29,70,000) එකී මුදල සහ 2006 ඔක්තෝබර් මස 09 දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් ඒ මත පොළිය ද රුපියල් තිස් අට ලක්ෂ හැත්තෑ හය දහස් දෙසිය දහතුනයි ශත විසි එකක (රු. 38,76,213.21) මුදල සහ ඒ මත වර්ෂයකට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් තව දුරටත් වූ පොලිය ද, විකිණීමේ ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද එදිනට තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 2363 හා 1985 දින දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ රුක්මලේ ගමේ පිහිටියා වූ ද 'දෙල්ගහවත්ත සම්බුද්දි ගොඩපොරගහවත්ත' යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. හෙට්ටිගේ විසින් සාදන ලද අංක 3786 සහ 2003 දෙසැම්බර් මස 11 වැනි දින දරන පිඹුරේ ලොට් X ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : අංක 8458 පිඹුරේ ලොට් අංක 6 හා 13 (පාර ද), නැගෙනහිරට : (මීටර් 6 සිට 5 දක්වා පළල් පාර) අංක 8458 පිඹුරේ දක්වා ඇති ලොට් අංක 13 ද, දකුණට : අංක 8458 පිඹුරේ ලොට් අංක 3 ද, බස්නාහිරට : අංක 2220 දරන පිඹුරේ ලොට් බී සහ සී කොටස්වල ඉතිරි කොටස ද, මායිම් වන්නාවූ ද එකී අංක 3786 දරන පිඹුරට අනුව පර්චස් විස්ස (අක්කර 0, රූඩ් 0, පර්චස් 20) ක් විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේත් වේ.

පහත විස්තර කෙරෙන මාර්ග සඳහා වෙන් කිරීම් තුළින්, උඩින් හා දිගේ මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ.

ඉහත කී රුක්මලේ ගමේ පිහිටියා වූ ද, දෙල්ගහවත්ත සම්බුද්දි ගොඩපොරගහවත්ත යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් සාදන ලද අංක 8458 හා 2003 පෙබරවාරි මස 17 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 13 (මීටර් 6 සිට 5 දක්වා පළල පාර සඳහා වෙන් කිරීම) ලෙස ලකුණු කොට පෙන්නුම් කර ඇත්තාවූ ද, උතුරට : ලොට් 7 ද, නැගෙනහිරට : ලොට් අංක 8,9,10,11,12 සහ 15 ද, දකුණට : බාලිකා නිවාස පාර ද, බස්නාහිරට : ලොට් අංක 6,5,4,3,2,1 හා 14 ද, මායිම් වන්නාවූ ද එකී අංක 8458 දරන පිඹුරට අනුව පර්චස් විසි හතර (අක්කර 0, රූඩ් 0, පර්චස් 24) ක් විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 1432/211 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කලාප 11.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
(කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.

08-793

---

## මහජන බැංකුව – මැදිරිගිරිය (231) ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.01.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

පොලොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් පද්මිණී අත්තනායක මහත්මිය විසින් සහතික කරන ලද 2005.12.09 දිනැති අංක 888 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම, කාරියවසම් වික්‍රම ආරච්චිලාගේ දයාරත්න සහ

කාරියවසම් වික්‍රම ආරච්චිලාගේ ජනක මොහාන් පුෂ්ප කුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ අසූහත්දහස් දෙසීයක (රු. 1,87,200) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2006.02.26 දින සිට වර්ෂයකට 22.5% බැගින් රුපියල් එක්ලක්ෂ අසූහත්දහස් දෙසීයක (රු. 1,87,200) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ අසූහත්දහස් දෙසීයක (රු. 1,87,200) මුදල අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 888 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

## දේපල පිළිබඳ විස්තර

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, සිංහල පත්තුවේ, 100-බිසෝබණ්ඩාරගම ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ, බිසෝබණ්ඩාර නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ තබා ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක අ.ජ.පි.පො. 166 දරන රේඛා සටහනේ අංක 149 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇති, ඉඩමට බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ මහතා විසින් 2005.05.13 දින මැන සකස් කරන ලද අංක 2005/PO/24 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01ට මායිම්, උතුරට : අ.ජ.පි.පො. 166හි කැබලි අංක 148, නැගෙනහිරට : අ.ජ.පි.පො. 166හි කැබලි අංක 140, දකුණට : අ.ජ.පි.පො. 166හි කැබලි අංක 162, බස්නාහිරට : අ.ජ.පි.පො. 166හි කැබලි අංක 162, 106 යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම තුනයි අටයි හතර (හෙක්. 0.384) ක් විශාල ඉඩම හා එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි ආදි සියළු දේත් වේ. මෙම ඉඩම පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 4/2/251හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි (උතුරු මැද කලාපය).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නව නගරය,
පොළොන්නරුව.

දුරකථන අංක - 027-2224404, 2225760, 2223900, 2223522,
ෆැක්ස් - 027-2223522.
ඊ-මේල් - pol@rho.peoplesbank.lk

08-794

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-පිටකොටුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.07.31 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. සී. පී. වෙත්තසිංහ විසින් සහතික කරන ලද්දා වූ 2003.02.11 දිනැති අංක 1967 දරන බැඳුම්කරය යටතේ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දා වූ 2004.07.20 දිනැති අංක 2136 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම යටියන ආරච්චිගේ සුජීව ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හත්ලක්ෂ අනූතුන්දහස් පන්සිය අටයි ශත පනස්හතර (රු. 7,93,508.54) ක මුදලක් 2007.06.22 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් 7,93,508.54ක මුදලට 2007.06.22 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 1967 සහ 2136 දරන බැඳුම්කර මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තර කර ඇත්තා වූ දේපළ සහ පරිශ්‍රය කොළඹ වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බොරලැස්ගමුව පිහිටි සූරම්‍යා මාවතේ වරිපනම් අංක 70/13 දරන 'කටහගහවත්ත' නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද 2001.07.05 දිනැති අංක 3110 දරන පිඹුරෙන් බෙදා වෙන්කර විස්තරකර සලකුණු කරන ලද ලොට් 1ඒ දරන ඉඩම් කොටස උතුරට : සූරම්‍යා මාවතින් ද, නැගෙනහිරට : ලොට් 1බී වලින් ද, දකුණට : සූරම්‍යා මාවතේ වරිපනම් අංක 70/9 න් ද, බස්නාහිරට : සූරම්‍යා මාවතේ, වරිපනම් අංක 70/2න් ද මායිම් වූ එකී අංක 3110 දරන පිඹුර ප්‍රකාර පර්චස් අටයි දශම හතරයි දෙක (අ. 0, රූ. 0, පර්. 8.42) ක් විශාල ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි සියළුදේත් සමග ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2640/138 දරන ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

08-805/1

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-මොරටුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.05.03 දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 2001.12.14 දින සහ අංක 5090 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කොළඹපටබැදිගේ ලීනස් සුසිත් ප්‍රනාන්දු ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් නවලක්ෂ විසිතුන්දහස් නවසිය

හයයි ශත පනහ (රු. 9,23,906.50)ක මුදලක් 2005.09.28 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 9,23,906.50ක මුදලට 2005.09.29 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 5090 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සහා සීමාව තුළ කල්දමුල්ලේ පිහිටි ආතර්ස් පෙදෙසේ වරිපනම් අංක 5/5 දරන කුට්ටේරියාවල වතුයාය නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක බී. එෆ්. ගෝමස් විසින් මැන සාදන ලද 1956 මැයි මස 05 වැනි දිනැති අංක 68 දරන පිඹුරේ ලොට් 28ඒ ලෙස සලකුණු කරන ලද ඉඩමට උතුරට : මෙම ඉඩමේම ලොට් 28සී දරන ඉඩමෙන් ද, නැගෙනහිරට සහ දකුණට : ලොට් 28ඩී ලෙස සලකුණු කරන ලද මෙම ඉඩමේම කොටසකින් (පාරක් සඳහා වෙන් කරන ලද) බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 28බී දරන කොටසින්ද මායිම් වූ පර්චස් දොලහක් විශාලත්වයෙන් යුතු ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2203/104 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 5090 දරන උකස් බැඳුම්කරයේ සඳහන්ව ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

08-805/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.